# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1776/43 - 2012 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා - 2012.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, ආසියානු සංවර්ධන බැංකු 5 ව්‍යාපෘතිය යටතේ හලාවත ජල සම්පාදන ක්‍රමයේ තුළුමං ළිං ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 14 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/979.

උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 568 මුන්නේෂ්වරම ග්‍රාම නිලධාරි වසමේ මුන්නේෂ්වරම ගමේ පිහිටි ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථාන නැමති ඉඩම නොහොත් මුන්නේෂ්වරම පන්සල් ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු ජී.වී.බී. ධර්මරත්න මහතා විසින් 2011.07.14 දිනැතිව පිළියෙල කරන ලද සැලැස්මේ දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.012 (පර්චස් 5) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:–

| | | |
|---|---|---|
| *උතුරට* | : | මුන්නේෂ්වරම විහාරස්ථානය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මුන්නේෂ්වරම විහාරස්ථානය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස හා මුන්නේෂ්වරම සිට ගම්මානයට යන ප්‍රාදේශීය සභා පාර ; |
| *දකුණට* | : | මුන්නේෂ්වරම විහාරස්ථානය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස හා මුන්නේෂ්වරම සිට ගම්මානයට යන ප්‍රාදේශීය සභා පාර ; |
| *බටහිරට* | : | මුන්නේෂ්වරම විහාරස්ථානය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* විහාරාධිපති,
ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානය,
මුන්නේෂ්වරම,
හලාවත.

10-367

1A - G 16642 — 350 (2012/09)

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට අනුරාධපුර උතුර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ඇතාකඩ ජල කුළුණ හා නිල නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 14 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/980.

**උපලේඛනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇතාකඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඇතාකඩ ගමේ පිහිටි හින්න උඩ ඉඩම නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 01 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස අත්කර ගැනීම :–

| | | |
|---|---|---|
| *උතුරට* | : | මැදවච්චිය - කැබිතිගොල්ලෑව ප්‍රධාන මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | බී. කිරිබණ්ඩා මහතා හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය :*

01. පත්මා චන්ද්‍රසේකර මහත්මිය,
අලව්ව.

02. සුසිලා චන්ද්‍රසේකර මහත්මිය,
මොරගොඩ, ශ්‍රාවස්තිපුර.

03. මාලකී චන්ද්‍රසේකර මහත්මිය,
දිවුල්වැව.

04. කමලා චන්ද්‍රසේකර මහත්මිය,
ශ්‍රීපාලි, කරපික්කඩ පාර, මැදවච්චිය.

10-368

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට මාතලේ පලාපත්වල ජල සම්පාදන ක්‍රමයේ උඩුගම ජල ටැංකිය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 14 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/981.

උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මකුල්ගහරුප්ප ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩුගම ගමේ පිහිටි ගල්කඩුවේ වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 30 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:–

| | | |
|---|---|---|
| *උතුරට* | : | මංජු ශ්‍රී උඩුගම මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ඉඩම (මු.පි.මා./1395 හි කැබලි අංක 01) ; |
| *දකුණට* | : | උඩුගම - මකුල්ගහරුප්ප ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| *බටහිරට* | : | විජේකෝන් මහතා සහ වෙනත් අය හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. එච්. ඒ. බී. සේනක මංජු ශ්‍රී උඩුගම මහතා,
උඩුගම වලව්ව,
පලාපත්වල,
මාතලේ.

10-369

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.